
ශ්‍රේණිය - 09 ශ්‍රේණිය
විෂය - බුද්ධ ධර්මය
වාරය - II වාරය
පාඩම - 10 වැනි පාඩම
ඒකකය - ඉටු කරමු යුතුකම්.

කිසියම් සමාජයක යහපැවැත්ම සඳහා ප්‍රධාන සාධක දෙකක් ලෙස යුතුකම් හා වගකීම් පෙන්වාදිය හැක.

සමාජයේ සෑම පුද්ගලයෙක්ම සුචරිත ක්‍රියාවන්හි යෙදීමෙන් සාරධර්ම අගයමින් ආධ්‍යාත්මික දියුණුව මෙන්ම සමාජ සංවර්ධනය ද ඇති කර ගැනීමට බුදු දහම මග පෙන්වා දී ඇත.

ඒ පිළිබඳව සඳහන් වන වැදගත්ම සූත්‍ර දේශනාව වන්නේ සිගාලෝවාද සූත්‍රයයි.

පෙරදිග මාපියන් - දකණේ ඇදුරුතුමන්
බටහිර අඹු දරුවන් - උතුරේ මිතුරු රුවන්
යට දැසි දසුන් - ගුවනේ හාමුදුරුවන්
මෙලෙසින් දෙසා ඇත - සදිසා තිලෝගුරුන්

# සේව්‍ය - සේවක යුතුකම්

සේවක පක්ෂය යනු කිසියම් ආයතනයක අයිතිකරුවන්, කළමණාකරුවන්, අධ්‍යක්ෂකවරුන් වේ. සේවකයන් යනු ඔවුන් යටතේ සේවය කරන පිරිසය.

- සේව්‍ය - සේවක සම්බන්ධතාව රියසකෙහි චක්‍රය (රෝදය), නාභිය (බොස් ගෙඩිය) සහ අර (ගරාදි) අතර සම්බන්ධය මෙන් පවතින්නේය. රියසක නොකැඩී කැරකෙන්නේ බොස් ගෙඩිය හා ගරාදිය අතර සම්බන්ධය ඇති විටය.

- සේව්‍ය - සේවක දෙපක්ෂයටම ඉහළ ඵලදායිතාව සඳහා ඔවුන් අතර අන්‍යෝන්‍ය සබඳතාවය ඉතා වැදගත්ය.

- මානව ප්‍රජාවේ පැවැත්ම සඳහා බුද්ධිමය හා කායික ශ්‍රම දායකත්වය මුල් කරගත් නිෂ්පාදන හා සේවා අත්‍යවශ්‍යය. එම මත මානව ප්‍රජාවේ ඉදිරි ගමන පවතින අතර සේවකයා එහි පදනමය. සිගාලෝවාද සූත්‍රයේ සේව්‍ය - සේවක සබඳතාව යට දිශාව ලෙස දක්වා තිබේ. එහි ස්වාමියා විසින් සේවකයාට වගකිවයුතු කරුණු 5කි.

මෙම ඉගැන්වීමෙන් පෙන්වා දී ඇත්තේ සේවකයාගෙන් කෙසේ හෝ වැඩ කරවා ගැනීම නොව ඉතා ලෙන්ගතුව ඔහුගේද යහපත උදාකරමින් සේවය ලබා ගැනීම වේ.

## 01. ඔවුන්ගේ හැකියාවට ඔරොත්තු දෙන ලෙස වැඩ කටයුතු පැවරීම.

### ශක්ති ප්‍රමාණයට අනුව වැඩ පැවරීමෙන් ඇති වන වාසි

- හොද සේවාවක් ලබා ගත හැකිය.
- සේවකයා තෘප්තියට පත් වෙයි.
- වැඩ මග හැරීම හෝ කල් දැමීම සිදු නොවේ.
- තම රාජකාරිය මැනවින් ඉටු කරයි.
- දැනුම හා පුහුණුව ඇති අයට ඒ ඒ කාර්යය පැවරීමෙන් වඩා ඵලදායි සේවාවක් ලබා ගත හැකි වීම.

### අධික ලෙස වැඩ පැවරීමෙන් ඇති වන අවාසි

- සේවකයා අතෘප්තියට පත් වෙයි.
- වැඩ මග හරී. මැනවින් නොකරයි.
- මානසික චිත්ත පීඩා වලට පත් වෙයි.
- හොද සේවාවක් නොලැබෙයි.
- අපේක්ෂිත ඉලක්ක කරා ගමන් කිරීමට සේවකයාගෙන් ලැබෙන වඩා ඵලදායි සේවාව වියැකී යයි.




## 02. ආහාර පාන වැටුප් ආදිය යහපත් ලෙස ලබා දීම.

සෑම පුද්ගලයෙකුටම මුදල් අත්‍යවශය. සේවකයාට ජීවත් වීමට ප්‍රමාණවත් ශ්‍රමයට සරිලන වැටුපක් සහ යැපීමට ප්‍රමාණවත් ආහාරපාන ලබා දීම ස්වාමියා සතුය. එවිට වැඩ වර්ජන, වැඩ පැහැර හැරීම්, අල්ලස් දූෂණ අවම වේ.

## 03. ඔවුන් අසනිප වූ විට වෛද්‍ය උපකාර ලබා දීම.

සේවකයා කෙරෙහි නිසි සෞඛ්‍ය පහසුකම් ලබා දීම. ඔහුගේ කායික පෝෂණය පමණක් නොව මානසික පෝෂණයටද ස්වාමියා වග කිව යුතුය. සේවකයා අසනිප වු විට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබා දීම මගින් ලැබෙන ප්‍රයෝජන කිහිපයකි.

1. නිරෝගී සේවයා මැනවින් කාර්යයේ නිරත වෙයි.
2 ස්වාමියා අත් නොහැරේ.
3. කෘතවේදීව කටයුතු කරයි.
4. කැපවීමෙන් ලබැදියාවෙන් සේවයේ නිරතවෙයි.
5. ස්වාමියාත් ආයතනයත් ආරක්ෂා කර ගනී.

## 04. විශේෂ රසවත් දේවල් ඔවුන් සමග බෙදා හදා ගැනීම.

ස්වාමියා විසින් නිතර රසවත් ආහාර පාන ආදිය සේවක සේවිකාවන්ටද බෙදා දී අනුභව කළ යුතු වන්නේ සේවකයාගේ ශ්‍රමය මත තම දියුණුව රදා පවතින බව හොදින්ම අවබෝධ කරගෙනය. එවිට සේවකයා ආයතනය කෙරෙහි හා ස්වාමියා කෙරෙහි මනා බැඳීමක් ඇති කර ගනී.

## 05. අවශ්‍ය අවස්ථාවන්හිදී සේවකයන්ට නිවාඩු ලබා දීම.

සේවකයාගෙන් මනා සේවාවක් ලබා ගැනීම සදහා ස්වාමියා විසින් අවශ්‍ය අවස්ථාවලදී නිවාඩු ලබා දීම හා නිසි කළට විශ්‍රාම ලබා දී සේවකයාට අවශ්‍ය විවේකය ලබා දිය යුතුය. එවිට ඵලදායි සේවාවක් ලබා ගත හකිය.

මෙසේ සංග්‍රහ ලබන සේවකයාද අවංකවම කැපවීමෙන් තම වගකීම ඉටු කළ යුතුය. එම සේවයා ස්වාමියා කෙරෙහි ක්‍රියා කළ යුතු ආකාර 05කි.

01. ස්වාමියාට පළමුව අවදි වීම.
02. ස්වාමියාට පස්ව නින්දට යාම.
03. දුන් දේ පමණක් ගැනීම.
04. මැනවින් නියමිත වැඩ කටයුතු කිරීම.
05. ස්වාමියාගේ ගුණ කීම.

## 01. ස්වාමියාට පළමුව අවදි වීම.

- ස්වාමියාට පළමු අවදිව දෛනික වැඩ කටයුතු අරඹයි.
- දෛනි වැඩ කටයුතු නිමා කරයි.
- අනවශ්‍ය විදුලි පහන් නිවා දමයි.
- ස්වාමියාට පසුව නින්දට යයි.

## 02. ස්වාමියාට පසුව නින්දටයාම.

- නියමිත වේලාවට පෙර සේවා ස්ථානයට පැමිණෙයි.
- නියමිත කාර්යය මනාව ඉටු කරයි.
- ආයතනයේ ආරක්ෂාව තහවුරු කර අවශ්‍ය විධි විධාන නිමවා ආයතනයෙන් බැහැර වෙයි.

## 03. දුන් දේ පමණක් ගැනීම

- දුන් දේ ගැනීමට පමණක් පුරුදු වෙයි.
- තම ස්වාමියාට හෝ ආයතනයට එරෙහි නොවෙයි.
- එය රැක බලා ගැනීමට ඇප කැප වෙයි.
- එය ආයතනයේත් පුද්ගලයාගෙත් යහපැවැත්ම තහවුරු කරයි

## 04. මැනවින් නියමිත වැඩ කටයුතු කිරීම.

- තමාට පැවරී ඇති වැඩ කොටස මැනවින් අවංකව කැපවීමෙන් නිසි කළට වේලාවට ඉටු කිරීමට උත්සාහවත් විය යුතුය.
- එවිට පමණක් ස්වාමි සේවක සබදතා මැනවින් ආරක්ෂා වෙයි.

## 05. ස්වාමියාගේ ගුණ කීම

ඉතා උසස් ස්වාමි - සේවක සබඳතාවක් පවත්වා ගැනීම සඳහා උපකාරී වන්නේ ස්වාමියා සතු ඉතා කුඩා හෝ වරදක් මහත් කොට නොදක්වා ඒ වරද පමණක් ගෙන නොසිතා ස්වාමිය සතු යම් කුඩා ගුණයක් ඇත්නම් එය අගය කිරීමයි.

මෙලෙස අන්‍යෝන්‍ය යුතුකම් ඉටුවන විට කිසියම් සමාජයක යහ පැවැත්ම සඳහා ප්‍රධාන සාධක දෙක් ලෙස යුතුකම් හා වගකීම් පෙන්වා දිය හැක.

සමාජයේ සෑම පුද්ගලයෙක්ම සුචරිත ක්‍රියාවන්හි යෙදීමෙන් සාරධර්ම අගයමින් අධ්‍යාත්මික දියුණුව මෙන්ම සමාජ සංවර්ධනයද ඇති කර ගැනීමට බුදු දහම මග පෙන්වා දී ඇත. ඒ පිළිබඳ සඳහන් වන වැදගත්ම සූත්‍ර දේශනාව වන්නේ සිගාලෝවාද සූත්‍රයි.

අයිතිවාසිකම් වෙනුවෙන් කරන වැඩ වර්ජන, උද්ඝෝෂණ, අරගල නැති වී එම ආයතනය නිවස ප්‍රසන්න සාමකාමී තැනක් බවට පත් වෙයි.


# ගිහි පැවදි යුතුකම්

බෞද්ධ සමාජය සිව්වනක් පිරිසෙන් යුක්තය. ඒය ගිහි පැවිදි යනුවෙන් දෙයාකාරය. මෙම දෙපිරිසසේ අභියෝගයට හේතුවන උපදෙස් මලාවක් සිගාලෝවාද සුතයේ දක්වා ඇත.

ගිහි සමාජය ලෞකික සහ ලෝකෝත්තර අභිවෘද්ධිය උදෙසා මග පෙන් වීම සිදු කලේ භික්ෂුන් වහන්සේලාය. සමස්ත සමාජයම ඉතා ඉහළ අධ්‍යාත්මික සහ සදාචාරාත්මක දියුනුවක් ඇති කිරීමට මග පෙන්වුයේ සංඝ රත්නයයි. ලාංකීය ජනතාව ජීත පරිත්‍යාගයේ පවා උන්වහන්සේලා ආරක්ෂා කිරීමට බැදී සිටි. සිගාලෝවාද සුතයේ ගිහියන් විසින් පැවැදි උතුමන් වෙත ඉටු කළ යුතු යුතුකම් 5කි.

# ගිහියන් විසින් පැවිද්දට කල යුතු යුතුකම් පහ

- මෙත්තා සහගත කාය කර්මයෙන් යුතුවීම
- මෙත්තා සහගත වචී කර්මන් යුතු වීම
- මෙත්තා සහගත මනෝ කර්මයෙන් යුතු වීම
- නොවැසූ දොරින් යුතු වීම
- සිවු පසයෙන් උපස්ථාන කිරීම



### 01. මෙත්තා සහගත කාය කර්මයෙන් යුතුවිම.

- බස් රථයකදී ආසනයක් ලබා දීම.
- මහ මගදී ගරු කිරීම.
- විහාරස්ථානයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම. තමාගේ ආගමික කටයුතු සිදු කරගැනීම ආදී සියලු කටයුතු කිසිවෙකුගේ මෙහෙය වීම නිසා නොව සාසනික හැගීමෙන් මෛත්‍රී සහගතවම කළ යුතුය.

### 02. මෙත්තා සහගත වචී කර්මන් යුතු වීම.

- භික්ෂුන් වහන්සේට ආමාන්ත්‍රණය කිරීමේදී කට පුරා සිත පුරා ගෞරව සම්ප්‍රයුත්තව ආමන්ත්‍රණය කළ යුතුය.
- භික්ෂුන් වහන්සේලා සමග කතා කරණ සෑම වචනයක්ම මෛත්‍රී සහගත විය යුතුය.



## 03. මෙත්තා සහගත මනෝ කර්මයෙන් යුතු වීම.

- උන්වහන්නේලා පිළිබඳ සිතන සෑම සිතුවිල්ලක්ම මෛත්‍රී සහගත විය යුතුය.
- ගිහියාගේ මෛත්‍රී සහගත සිතුවිලි පදනම් කරගෙන කටයුතු කළ නිසාම භික්ෂුවගේ පැවැත්ම පහසු වන අතර ඒය ගිහියාටද මහත් පිනකි.

## 04. නොවැසූ දොරින් යුතු වීම.

- භික්ෂුන් වහන්සේ නමක් තම නිවසට වැඩි විට ගෙරවයෙන් ආසන පනවා පිළි ගැනීම සහ ශාසණික අවශ්‍යතා සපුරා ගැනීමට හැකි උපරිමයෙන් ගෞරවයෙන් කටයුතු කළ යුතුය.
- එසේම උන්වහන්සේලා පෝෂණය කිරීම ගිහියාගේ වගකීමකි.

# 05. සිවු පසයෙන් උපස්ථාන කිරීම

- චීවර පින්ඩපාත සේනාසන ගිලානපත්‍ය ආදී අවශ්‍යතා සොයා බලා කටයුතු කිරීම ගිහි පින්වතුන්ගේ යුතුකමකි.

මෙලෙස ආමිෂයෙන් උපකාර ලබන භික්ෂුන් වහන්සේ විසින් ගිහියා කෙරෙහි ධර්ම දානයේන් ප්‍රති උපකාර කළ යුතු බැව් සිගාලෝවාද සූතයේ දැක්වෙයි.

# පැවිද්දා විසින් ගිහියාට ඉටුවිය යුතු යුතුකම්



- පවින් වැලැක්විම.
- යහපතෙහි යෙදවීම.
- අනුකම්පා සිතින් ක්‍රියා කිරීම.
- නො ඇසු දේ කියාදීම.
- ඇසු දේ මානව පැහැදිලිකරදීම.
- ස්වර්ගමෝක්ෂ මාර්ගය කියාදීම.

සත්පුරුෂ ආශ්‍රය සමාජයේ යහපත පිණිස උපකාර වේ. සුවඳ පරිසරය නිසා පරිසරය සුවඳ වන්නා මෙන් භික්ෂුන් වහන්සේගේ ඇසුර නිසා සමාජය නැමැති පොකුණ සුවද වත් වන්නේය.

භික්ෂුන් වහන්සේ උපායශීලීව හෝ ගිහියා පාපයෙන් වලක්වා ගත යුතුය. ධර්මානු ශාසනා කොට පාපයෙන් මුදවා ගත යුතුය. ගිහියාගේ සාසනික හා අධ්‍යාත්මික අභිවෘද්ධිය දැක ආශිර්වාද කිරීම භික්ෂුන් වහන්සේගේ යුතු කමකි. එමගින් ගිහියාට මානසික සුවයක් සතුටත් ලැබේ. දහම පිළිබඳ මනා අවබෝධයක් ඇති භික්ෂුන් වහන්සේ ගිහියා කෙරෙහි අනුකම්පාවෙන් නොඇසූ දහම් දේශනා කරමින් ඔහු බණ දහමින් පෝෂණය කිරීමත් ඇසූ දහම් සැක තැන් ඇතොත් ඒවා පහදා දීමත් කරුණාව පෙරදැරිව කළ යුතු යුතුකමක් බව බුද්ධ දේශනායයි.

මෙලොව භෞතික අධ්‍යාත්මික දියුනුව ඇති කර ගැනීමට මෙන්ම පරලොව සුගති ගාමී විමටද බුදු දහම අදාල කරගත හැකි අතර අහේතුකව ගිහියාට අවබෝධ කරවීම ස්වාමීන් වහන්සේගේ පරම යුතුකම වන්නේය.

# ක්‍රියාකාරකම්

1. යුතුකම් හා වගකීම් පිළිබඳ ඉගැන්වෙන බෞද්ධ සූත්‍ර දේශනාව නම් කරන්න.

2. පුද්ගලයාගේ අභිවෘද්ධිය කොටස් දෙකකින් යුක්තය. ඒවා ලියා දක්වන්න.

3. බුදු දහමින් සුපෝෂිත ශ්‍රේෂ්ඨ කලා නිර්මාණ තුනක් නම් කරන්න.

4. "නිදොස් කෙනෙක් මෙදියත උපදින්නේ නැත" යන පද පේළියේ අර්ථය ලියන්න.

5. ආමිස දානයට අයත් පූජාවන් කිහිපයක් ලියන්න.

6. පැවිදි පක්ෂය වෙතින් ගිහි අය වෙත කෙරෙන යුතුකම් ලියන්න.


පිළිතුරු
1. සිඟාලෝවාද සූත්‍රය
2. ලෞකික අභිවෘද්ධිය / ලෝකෝත්තර අභිවෘද්ධිය
3. මහා දාගැබ්, විශාල වැව් අමුණු, වෙහෙර විහාර
4. මෙලොව ඕනෑම කෙනෙකු තුළ කුඩා හෝ වරදක් තිබිය හැකි බවයි.
5. දන් දීම, සිවුරු පිරිකර පූජා කිරීම, විහාරාරාම පුජා කිරීම, ඖෂධ පූජාව
(චීවර, පින්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය)
6. අයහපතෙන් වලක්වා ගැනීම.
යහපතේ යෙදවීම.
මෛත්‍රී සිතින් ආශිර්වාද කිරීම.
නොඇසූ දහම් කියා දීම.
ඇසූ දහම් කරුණුවල සැක තැන් දුරු කිරීම.
සුගතියට මග කියා දීම.


තෙරුවන් සරණයි